Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### රත්තොට ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ රත්තොට ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම උපලේඛනයේ සඳහන් සුදුසුකම් ඇති රත්තොට ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| විදුලි කාර්මික (III පංතිය සේවක ගණය : ප්‍රාථමික ශ්‍රේණිය අර්ධ ශිල්පීය) | 01 | රා.ප.ච. අංක 03/2016 අනුව (පීඑල් 2-2016) - (රා.ප.ච. 03/2016 උපලේඛනය II අනුව වැටුප් ගෙවනු ලැබේ.)<br><br>රු. 25,250.00 - 10x270-10x300-10x330-12x350-රු.38,450.00 (හතරවැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.<br><br>*ශිල්පීය නිපුණතා :*<br><br>අදාල තනතුරට නියමිත කාර්මික නිපුණතා පත්වීම් බලධාරියා විසින් අපේක්ෂා කරන මට්ටමට අත්පත් කරගෙන තිබිය යුතු යි.<br><br>*අ.* ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමේ (NVQ2) හෝ 3 වන මට්ටමේ (NVQ3) සහතිකය ලබා තිබීම<br>*හෝ*<br>*ආ.* කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම *හෝ,*<br>*ඇ.* ජාතික තරුණසේවා සභාවේ (NYSC) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම *හෝ,*<br>*ඈ.* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදරා සහතිකය ලබා තිබීම *හෝ,*<br>*ඉ.* ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාලව වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම *හෝ,*<br>*ඊ.* තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාලවූ වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br><br>*පළපුරුද්ද :*<br>තනතුරට අදාල අවුරුදු 02 ක පළපුරුද්දක් ලබා තිබිය යුතු යි. |

| තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|
| ආදාහනාගාර ක්‍රියාකරු සහායක III පංතිය සේවක ගණය :- ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන | 01 | රා.ප.ච. අංක 03/2016 අනුව (පීඑල් 1-2016) - (රා.ප.ච. 03/2016 උපලේඛනය II අනුව වැටුප් ගෙවනු ලැබේ.)<br><br>රු. 24,250.00 - 10x250-10x270-10x300-12x330-රු.36,140.00 (හතරවැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |
| රියදුරු (III පංතිය සේවක ගණය :- ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය) | 01 | රා.ප.ච. අංක 03/2016 අනුව (පීඑල් 3-2016) - (රා.ප.ච. 03/2016 උපලේඛනය II අනුව වැටුප් ගෙවනු ලැබේ.)<br><br>රු. 25,790.00 - 10x270-10x300-10x330-12x350-රු.38,990.00 (හතරවැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | *අධ්‍යාපන සුදුසුකම්* :-<br>අධ්‍යාපන පොදු සහිතක පත්‍ර සමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත්වී තිබිය යුතු යි.<br><br>*වෘත්තීය සුදුසුකම්* :-<br>මොටර් රථ ප්‍රවහන කොමසාරිස් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. ඊට අමතරව යන්ත්‍ර ක්‍රියා කරවීම සම්බන්ධ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් 4 වෙනි මට්ටම (NVQ - 4) සහතිකය ලබා තිබීම අමතර සුදුසුකමක් සේ සැලකේ.<br><br>*පළපුරුද්ද* :-<br>මෝටර් රථ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම (සහතික මගින් සනාථ කළ යුතු යි.)<br><br>කායික සුදුසුකම් :-<br><br>සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමකින් යුක්ත විය යුතු අතර, දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු යි.<br>අවම උස අඩි 05 අඟල් 2 1/2 ක් විය යුතු යි. |

01. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිත ය.

(ii) වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු දායකත්වය හිමි වේ.

(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. සීමිත පදනම මත බඳවා ගනු ලබන සේවකයන් අවුරුදු 01 ක පරීක්ෂණ කාලයකට යටත් වේ. මෙම කාලය තුළ දී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම්, පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

(iv) රා.ප.ච. 01/2014 අනුව පත්වීමේ දින සිට වසර 05 ක් ඇතුළත සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අමතරව අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම ලබාගත යුතු ය.

(v) මෙම බඳවා ගැනීම් කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, මධ්‍යම පළාත් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය* :-

**විදුලි කාර්මික :-**

*අ.* අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියළුම දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ.

*ආ.* සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු වී පවත්නා තනතුරු සංඛ්‍යාවට සමාන වඩාත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සංඛ්‍යාවක් තෝරාගෙන බඳවා ගැනේ.

**ආදාහනාගාර ක්‍රියාකරු සහායක :-**

*අ.* අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියළුම දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ.

*ආ.* සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු වී පවත්නා තනතුරු සංඛ්‍යාවට සමාන වඩාත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සංඛ්‍යාවක් තෝරාගෙන බඳවා ගැනේ.

**රියදුරු :**

*විවෘත බඳවා ගැනීම*

පහත සඳහන් පරිදි පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයින්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

**1. ලිඛිත විභාගය :**

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* | *විෂයය නිර්දේශය* |
|---|---|---|---|---|
| 1. මාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% | මාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |

**2. වෘත්තීය පරීක්ෂණය :**

| *පරීක්ෂාකර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු සීමාව* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය/යන්ත්‍ර ක්‍රියා කරවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය. අවශ්‍ය සියළුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු ඉහලම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. |
| 2. මහා මාර්ග නීති පිළිබඳව ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

---

*සීමිත බඳවා ගැනීම* :

දැනටමත් රත්තොට ප්‍රාදේශීය සභාව තුළ ස්ථිර තනතුරක සේවය කරන, රියදුරු තනතුර සඳහා අදාල වන මූලික සුදුසුකම් සපුරා ඇති සේවකයින්ගෙන් මේ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවා ගැනීම සඳහා මෙම *ගැසට්* නිවේදනයේ දක්වා ඇති අනෙකුත් සුදුසුකම් හා කොන්දේසි සියල්ල සීමිත බඳවා ගැනීම සඳහා ද අදාල වේ. බඳවා ගැනීමේදී කායික මානසික යෝග්‍යතාව හා අධ්‍යාපන වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයක දී සුදුසුකම් ලබාගත යුතු යි.

*බඳවා ගන්නා අනුපාතය (රියදුරු) :*

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |

*03. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :-*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

(ii) අයදුම්කරුවන් රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය.

(iii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (සීමිත බඳවා ගැනීම සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

(iv) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමකින් යුක්ත විය යුතු යි. (රියදුරු තනතුර සඳහා පමණක් අදාල වේ.)

(v) රත්තොට ප්‍රාදේශීය සභාවේ දැනට තාවකාලික අනියම් හෝ ආදේශක පදනම මත සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(vi) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර, දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.

(vii) රජයේ/ පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතු ය.

(viii) මෙම බඳවා ගැනීම සඳහා වන සියළු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු යි.

(ix) අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන කාලසීමාව අතුරතුර කාලයේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස්කම් කිරීම හේ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලය රත්තොට ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

*අයදුම්පත් යොමු කළයුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය අනුව ඒ -4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන ලද අයදුම්පත් 2017.10.13 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, රත්තොට ප්‍රාදේශීය සභාව, රත්තොට" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ, ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු යි. (දැනටමත් රත්තොට ප්‍රාදේශීය සභාවේ සේවය කරන අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු යි.) අසම්පූර්ණ, අපැහැදිලි හෝ නියමිත දිනට නොලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතු යි.

(i) උප්පැන්න සහතිකය,

(ii) අධ්‍යාපන සහතික,

(iii) පදිංචි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද),

(iv) මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය,

(v) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්,

(vi) වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික,

(vii) රියදුරු බලපත්‍රයේ පිටපතක්, (රියදුරු තනතුර සඳහා පමණි),

(viii) ජාතික හැඳුනුම්පතේ පිටපතක්,

---

ආර්. එල්. ජයවර්ධන,
ලේකම්,
රත්තොට ප්‍රාදේශීය සභාව.

2017 අගෝස්තු මස 30 වැනි දින,
රත්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

*රත්තොට ප්‍රාදේශීය සභාව*

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ .......................... තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————————————.
02. මුලකුරු සමග නම :————————————.
03. ස්ථිර ලිපිනය :————————————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————.
05. උපන් දිනය : වර්ෂය :———— මාසය :————. දිනය :————
06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස : අවුරුදු :———— මාස :————.දින :————.
07. ජාතික හැඳුනුම්පත් අංකය :————————————.
08. දුරකතන අංකය :————————————. .
09. විවාහක/ අවිවාහක බව :————————————.
10. ස්ත්‍රී/ පුරුෂ භාවය :————————————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන්ද/ ලියාපදිංචි වීමෙන් ද/ යන වග :————————————.
12. රියදුරු බලපත්‍ර අංකය (අදාළ නම් පමණි) :————————————.
13. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න)

අ. පො. ස. (සා.පෙළ) විභාගය :
පළමුවර - සමත් වර්ෂය:———— විභාග අංකය :————

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

දෙවනවර - සමත් වර්ෂය:———— . විභාග අංකය :————

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

අ. පො. ස. (උ.පෙළ) විභාගය ඃ

සමත් වර්ෂය :______ . විභාග අංකය :______ .

| *විෂයය* | *සමාර්ථය* |
|---|---|
| 01.<br>02.<br>03.<br>04. | |

14. ඉල්ලුම්කරන තනතුරට අදාළ වෘත්තීය සුදුසුකම් :______________________________.

15. වෙනත් සුදුසුකම් :______________________________.

16. 1. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? :______________________________

    2. පිළිතුර "ඔව්" නම් විස්තර සඳහන් කරන්න:______________________________.

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බවට ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

________________________,

අයදුම්කරුගේ අත්සන.

දිනය :______________.

***අයදුම්කරුගේ අත්සන සහතික කිරීම***

අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසැල් ප්‍රධානියෙකු / විශ්‍රාමික ප්‍රධානියෙකු/ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයෙකු/ සමාදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතීඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරී ලත් නිලධාරයෙකු/ රු. 2,24,260.00 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජකවරයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු යි.

ඉහත අත්සන් කර ඇති ........................... මහතා මා හොඳින් දන්නා අඳුනන බවත්, ඔහු මා ඉදිරිපිට අත්සන් යෙදූ බවත්, මෙයින් සහතික කරමි.

______ ,

අත්සන හා නිල මුද්‍රාව

නම :____________________
තනතුර :____________________.
ලිපිනය :____________________
දිනය:____________________ .

***දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය***

මෙම ඉල්ලුම්කරු වන ........................... මහතා දැනට මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ........................... වශයෙන් සේවය කරන අතර, මොහු කිසියම් විනයානුකූල දඬුවමකට ලක්වී නොමැති බව පෞද්ගලික ලිපිගොනුව අනුව සහතික කරමි, අයදුම්පත නිර්දේශ කරමි.

______ ,

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

නම :____________________
පදවි නාමය :____________________
දෙපාර්තමේන්තුව/ ආයතනය:____________________ .
දිනය :____________________ .